# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2191/40 – 2020 සැප්තැම්බර් 04 වැනි සිකුරාදා – 2020.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 365/C, කරස්නාගල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කරස්නාගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/අත්/2019/186 හා 2019.05.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'B' – බලුදංගොල්ලකැලේ – ප්‍රමාණය: හෙක්. 0.3335 ක් පමණ

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන දම්මුලහේන පාර සහ කැබලි අක්ෂර A; නැගෙනහිරට: කැබලි අක්ෂර A, පාර සහ කේ. ඒ. සුනිල් හිමිකම් කියන බලුදංගොල්ලකැලේ සහ පොදු සුසානභූමිය; දකුණට: කේ. ඒ. සුනිල් හිමිකම් කියන බලුදංගොල්ලකැලේ සහ පොදු සුසානභූමිය; බටහිරට: පොදු සුසානභූමිය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන දම්මුලහේන.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය : 4-3/12/2018/WS/374.
2020 මාර්තු මස 12 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 448

1A – G 32804 – 11 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*